# පරීක්ෂක වාර්තාව

## අවසාන විභාගය - ජනවාරි 2014

## (58) බදුකරණය
(Taxation)

---

**ප්‍රශ්න අංක 01** - ලකුණු 35

**පරීක්ෂා කර ඇත්තේ කුමක්ද?**

2006 අංක 10 දරණ දේශීය ආදායම් බදු පනත හා එකී පනතට 2012/13 තක්සේරු වර්ෂය දක්වා සිදුවූ සංශෝධන අනුව පවත්නා සමාගම් බදු නීතිය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කොට ඇත.

**කාර්ය සාධනය - සතුටුදායක නොවේ නම් ඊට තුඩු දුන් හේතු**

1. <u>**බදු අනුපාත**</u> - එය අපනයනය සඳහා මෘදු සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනයේ නිරත පරිපාලිත සමාගමක් වන අතර බදු අනුපාතය 12% වේ. නමුත්, සමහර අපේක්ෂකයන් සාමාන්‍ය අනුපාතය වන 28% වැරදීමෙන් භාවිතා කොට තිබුණි.

2. <u>**කල්බදු දීමනාව**</u> - මුළු කල්බදු වටිනාකමින් ¼ ක් හා වර්ෂය තුළ දී ගෙවූ කල්බදු වාරික යන දෙකෙන් අඩු අගය සැළකිය යුතු වුවත් සමහර සිසුන් ඉඩදෙන කල්බදු දීමනාව ලෙස වැඩි අගය ගෙන තිබුණි.

3. <u>**ක්ෂය දීමනා**</u>

   i. සුදුසුකම් ලද ගොඩනැගිලි සඳහා ක්ෂය දීමනා අනුපාතය 10% වුවත්, සමහර අපේක්ෂකයන් පැරණි අනුපාතය වූ 6 2/3% වැරදි ලෙස භාවිතා කර තිබුණි.

   ii. කාර්යාල උපකරණ සඳහා යෙදිය යුතු නිවැරදි අනුපාත වන්නේ 2011 අප්‍රේල් 01 ට පෙර 12.5% ත් 2011 අප්‍රේල් 01 ට පසු 33 1/3% ත් ය. නමුත් සමහර අපේක්ෂකයන් 2011 අප්‍රේල් 01 ට පසු ඒවා ද ඇතුළුව මුළු කාලපරිච්ඡේදය සඳහාම 12.5% යොදා තිබුණි. තවත් සමහරු මුළු කාලපරිච්ඡේදය සඳහාම 25% භාවිතා කර තිබුණි.

   iii. කපන යන්ත්‍රය - කල්බදු යන්ත්‍ර සඳහා ක්ෂය දීමනා හිමි නොවන නමුත් 20% බැගින් ක්ෂය දීමනා ඉඩ දී තිබුණි. නමුත් සමහර අපේක්ෂකයන් 33 1/ 3 % බැගින් කල්බදු දීමනා ඉඩ දී තිබුණි.

   iv. බලශක්ති කාර්යක්ෂමතා කම්හල් උපකරණ සඳහා ක්ෂය දීමනා අනුපාතය 50% වුවත් බහුතරයක් භාවිතා කර තිබුණේ 33 1/3 % වේ.

4. <u>**කම්හල් කළමනාකරුගේ වාසස්ථානය සඳහා ගෙවූ කුලී**</u>

   බොහෝ අපේක්ෂකයන් මෙම ගැලපීම නිවැරදිව කර නොතිබුණ අතර ඔවුන් ඉඩ නොදෙන ප්‍රමාණය වන 3/ 4 ආපසු එකතු කර නොතිබුණි.

5. <u>විදේශ ගමන් වියදම්</u>
මෙහිදී 2% නීතිය අනුගමනය කළ යුතු නොවේ. මෙහිදී සමහර අපේක්ෂකයන් මහන යන්ත්‍රය ආනයනයට අදාළව චීනයට යාමට දැරූ විදේශ ගමන් වියදම් වැරදි ලෙස ඉඩ දී තිබුණි. ඉතිරි විදේශ ගමන් වියදම් දරා ඇත්තේ අපනයන ප්‍රවර්ධනය සඳහා විදේශ රටක පැවති වෙළඳ ප්‍රදර්ශනයකට වන අතර එය සම්පූර්ණයෙන් ඉඩදේ. නමුත් සමහර අපේක්ෂකයන් එයට ඉඩ දී නොතිබුණි.

6. <u>ප්‍රචාරණය</u>
සේවකයන් බඳවා ගැනීම සඳහා වන ප්‍රචාරණය ඉඩදෙන අතර අපනයන ප්‍රවර්ධනය සඳහා විදේශයන්හි දී කරන ලද ප්‍රචාරණය ද සම්පූර්ණයෙන් ඉඩදේ. නමුත් බොහෝ අපේක්ෂකයන් වැරදි ලෙස 1/4 ක් ආපසු එකතු කර තිබුණි.

7. සංග්‍රහ වියදම් සඳහා ඉඩදෙනු නොලැබේ. නමුත් සමහර අපේක්ෂකයන් කිසිදු වලංගු හේතුවක් නොමැතිව එයට ඉඩ දී තිබුණි.

8. ද්විතියික වෙළඳපොළ ගණුදෙනු සඳහා මතිමාත්‍ර බද්ද (notional tax) 10% කි. එය සමාගමේ ආදායමේ කොටසක් වන අතර මතිමාත්‍ර බද්ද බදු බැරක් ලෙස සැලකිය යුතු වේ. නමුත් සමහර අපේක්ෂකයන් දළ පොලී ආදායම ආදායමක් ලෙස ගෙන නොතිබුණි.

9. සමහර අපේක්ෂකයන් ඉදිරියට ගෙනා අලාභය වූ රු. 6,223,500 න් 35% ක් හිලව් කර ගත හැකි සීමාව ලෙස වැරදීමෙන් දක්වා තිබුණි. නමුත් හිලව් කළ හැකි අලාභ සීමාව වන්නේ එකතු ව්‍යවස්ථාපිත ආදායමෙන් 35% කි.

10. ප්‍රාදේශීය සභාවට ලබා දුන් රු.200,000 ක් වටිනා ප්ලාස්ටික් කසල බඳුන් සඳහා 100% ක් ඉඩදෙන අතර, සමාගමේ සේවක සුභසාධක සංගමයට කළ (අනුමත නොවන පරිත්‍යාගය) රු.50,000 සඳහා ඉඩ ලබා නොදේ. නමුත් සමහර අපේක්ෂකයන් සුදුසුකම් ලබන ගෙවීම් නිවැරදිව දක්වා නොතිබුණි.

### වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ

බොහෝ අපේක්ෂකයන් ක්ෂය දීමනා අනුපාතයන්ගේ වෙනස්වීම්, බදු අනුපාත වෙනස්වීම් ඇතුලත්ව ආදායම් බදු පනතට සිදුවූ වෙනත් සංශෝධනයන් පිළිබඳව නිසි පරිදි දැනුවත්ව නොමැති බව පෙනෙන බැවින් මෑත කාලීනව පනතට වූ සංශෝධන පිළිබඳව දේශනවල දී අපේක්ෂකයන් දැනුවත් කළ යුතු වේ. අපේක්ෂකයන් සිය දැනුම යාවත්කාලීන කරගැනීම අවශ්‍ය වේ.

## ප්‍රශ්න අංක 02 - ලකුණු 30

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද ?**
පුද්ගලයකුගේ ආදායම් බදු බැඳියාව ගණනය කිරීමේ හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කොට ඇත.

**කාර්ය සාධනය**
මෙම ප්‍රශ්නය සඳහා කාර්ය සාධනය සතුටුදායකය.
**කාර්ය සාධනය – සතුටුදායක නොවේ නම්, ඊට හේතු**

1. ලාභාංශ ආදායම හා පොළී ආදායම - බදු සඳහා යටත් වේද, නොවේ ද යන්න පැහැදිලිව දක්වා නොමැත.

2. බදු නිදහස් දීමනාව වන රු. 500,000 සහ සේවා නියුක්ත ආදායමේ නිදහස් දීමනාව වන රු. 100,000 වෙන් වෙන්ව දක්වා නොමැත.

3. එක් එක් ආදායම් සීමාවන් මත බදු බැඳියාව නිවැරදිව දක්වා නැත.

4. දුරකථන බිල්පත්වලින් 50% ක් සේවා නියුක්ත ආදායමට ගත යුතු නොවේ.

5. වාසස්ථානයේ වටිනාකම සැලකීමේ දී, සේවා නියුක්ත ආදායම මිලියන 1.8 ඉක්මවන බැවින් එය රු. 180,000/- ට සීමා වේ. මෙය නිවැරදිව කර තිබුණේ නැත.

6. වාහන දීමනාව මසකට රු. 50,000/- දක්වා බදු නිදහස් වේ.

7. නිවාස ණය සඳහා ගෙවූ පොළිය වෙනත් ආදායම් ප්‍රමාණය දක්වා අඩු කළ හැකිවේ. එනිසා රු. 117,000/- අඩු කරගත හැකි වුවද, සමහර සිසුන් එය නිවැරදිව සැළකිල්ලට ගෙන නොතිබුණි.

8. නිවාස ණයෙන් ආපසු ගෙවූ ප්‍රාග්ධන කොටස, සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය හා දහම් පාසලට කළ පොත් පරිත්‍යාගය සමහර අපේක්ෂකයන් විසින් සුදුසුකම් ලබන දීමනා ලෙස අඩුකර තිබුණි.

**වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ**

පහත දෑ පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් අපේක්ෂකයන් විසින්, පුද්ගලයෙකුගේ ආදායම් බද්ද ගණනය කිරීමට පුහුණුවිය යුතු වේ.

- පොළිය, භාණ්ඩාගාර බිල්පත් මත පොළී ආදායම
- සේවා යෝජකයෙකු විසින් ලබාදුන් වාසස්ථානයක වටිනාකම
- නිවාස කුලිය මත ශුද්ධ වාර්ෂික වටිනාකම ගණනය කිරීම
- සේවා නියුක්ත ආදායම මත වන සීමාවන්
- විවිධ සුදුසුකම් ලබන ගෙවීම්
- පුද්ගලයන්ට අදාළ වන බදු අනුපාත

## ප්‍රශ්න අංක 03 - ලකුණු 15

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද ?**

පහත දැක්වෙන ප්‍රධාන මාතෘකා තුන යටතේ හවුල් ව්‍යාපාරයක ආදායම් බදු වගකීම ගණනය කිරීමේ මූලික දැනුම පරීක්ෂා කොට ඇත.

1. බෙදිය හැකි ලාභය/ අලාභය ගණනය කිරීම.

2. දළ හවුල් ව්‍යාපාර ආදායම් බදු වගකීම.

3. බෙදිය හැකි ලාභය බෙදා හැරීම.

තව ද හවුල්කරුවකුගේ කලත්‍රයාගේ වැටුප බදු සඳහා කෙසේ ගැලපිය යුතුද යන්න පිළිබඳවද මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කොට ඇත.

**කාර්ය සාධනය**

කාර්ය සාධනය ප්‍රමාණවත් නැත. විශේෂයෙන් හවුල් ව්‍යාපාරයක ආදායම් බදු වගකීම ගණනය කිරීම සම්බන්ධව ඇති ප්‍රධාන ප්‍රතිපාදන පිළිබඳ න්‍යායාත්මක දැනුම අඩුය. (එනම් හවුල් ව්‍යාපාර සඳහා අදාල බදු අනුපාතය, බෙදිය හැකි ලාභය හවුල්කරුවන් අතර බෙදා හැරීම, බදු නිදහස් දීමනාව ආදිය)

**කාර්ය සාධනය – සතුටුදායක නොවේ නම් ඊට හේතු**

1. ගණිතමය ගැටළු සඳහා සිසුන් ප්‍රමුඛතාවය දී ඇති අතර මූලික සෛද්ධාන්තික සංකල්ප හා වැදගත් මූලධර්ම කෙරෙහි අඩු අවධානයක් යොමු කර ඇත.
2. සමාගම්වල ආදායම් බදු වගකීම ගණනය කිරීම කෙරෙහි ප්‍රමුඛත්වය දී ඇතත් හවුල් ව්‍යාපාර කෙරෙහි අඩු අවධානයක් යොමු කර ඇත.

**වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ**

1. සිසුන් මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සපයා පුහුණු විය යුතුය. එසේම ඔවුන්ගේ පිළිතුරු තර්කානුකූල ක්‍රමයකට ඉදිරිපත් කළ යුතු වේ.
2. තව ද, හවුල් ව්‍යාපාරයකට අදාළව බදු නිදහස් දීමනාව හා බදු අනුපාත පිළිබඳව අවබෝධය ලබාගත යුතු වේ.

## **ප්‍රශ්න අංක 04** - ලකුණු 10

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද ?**

මෙම ප්‍රශ්නයෙන් පහත දෑ පරීක්ෂා කොට ඇත.

1. ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) සඳහා යටත්වන ව්‍යාපාර කටයුතු
2. බැංකු තැන්පතු මත ලැබෙන පොලිය සඳහා අදාළවන රඳවා ගැනීමේ බදු (WHT) අනුපාත
3. "ලියාපදිංචි හඳුනාගත් ගැණුම්කරුවන්" ලෙස සරල කළ බදු ක්‍රමය (SVAT) යටතේ ලියාපදිංචි විය හැකි තැනැත්තන්
4. එකතු කළ අගය මත බද්ද ගණනය කිරීම

**කාර්ය සාධනය**

කාර්ය සාධනය සතුටුදායක නොවේ. බොහෝ අපේක්ෂකයන් මුළු ලකුණු ලබාගෙන තිබුණේ එකතු කළ අගය මත බද්ද ගණනය කිරීම සඳහා පමණි. ප්‍රශ්නයේ අනෙකුත් කොටස් සඳහා සපයා තිබූ පිළිතුරු ඉතා දුර්වලය.

**කාර්ය සාධනය – සතුටුදායක නොවේ නම් ඊට හේතු**

1. ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා යටත්වන කාර්යයන් පිළිබඳව සිසුන් සම්පූර්ණයෙන් දැනුවත් නැත.
2. තැන්පතු මත ලැබෙන පොලිය සඳහා අදාළවන රඳවාගැනීමේ බදු අනුපාත පිළිබඳව සිසුන් දැනුවත්ව නැත. බොහෝ සිසුන් මෙම කොටසට නිවැරදිව පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත.
3. සරල කළ බදු ක්‍රමය යටතේ "ලියාපදිංචි හඳුනාගත් ගැණුම්කරුවන්" ලෙස ලියාපදිංචි විය හැකි තැනැත්තන් සඳහා ඉතා දුර්වල පිළිතුරු දක්නට ලැබුණි.

**වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ**

1. අපේක්ෂකයන් NBT , WHT වැනි වෙනත් බදු පිළිබඳ දැනුම වර්ධනය කරගත යුතුය.
2. තව ද SVAT ක්‍රමය පිළිබඳව හොඳ අවබෝධයක් ලබාගත යුතුය.

## ප්‍රශ්න අංක 05 - ලකුණු 10

**පරීක්ෂා කර ඇත්තේ කුමක් ද ?**

ආර්ථික සේවා ගාස්තු, මුද්දර බද්ද වැනි වෙනත් බදු සඳහා අදාළවන ප්‍රධාන ප්‍රතිපාදන පිළිබඳ දැනුම සමඟ බදු පරිපාලනය පිළිබඳ සෛද්ධාන්තික දැනුම පරීක්ෂා කොට ඇත.

**කාර්ය සාධනය**

සාමාන්‍ය මට්ටමක කාර්ය සාධනයක් විය. බහුතරයක් ප්‍රශ්නයේ (b) කොටස අවබෝධ කරගෙන නොමැත.

**කාර්ය සාධනය – සතුටුදායක නොවේ නම් ඊට හේතු**

1. පනතේ සඳහන් පාරිභාෂික වචන පිළිබඳව දැනුම මඳකම නිසා බොහෝ සිසුන් ප්‍රශ්නයේ (b) කොටස සම්පූර්ණයෙන් වරදවා වටහාගෙන තිබුණි.
2. ආදායම් බද්ද වැනි ප්‍රධාන බදු කෙරෙහි ප්‍රමුඛතාවය දී ඇතත් ආර්ථික සේවා ගාස්තු, මුද්දර බද්ද වැනි අනෙකුත් බදු කෙරෙහි අඩු අවධානයක් යොමු කර ඇත.

**වැඩි දියුණු සඳහා නිර්දේශ**

1. සිද්ධාන්ත පිළිබඳව හොඳ අවධානයක් යෙදිය යුතුය.
2. සංකල්ප තර්කානුකූලව අවබෝධ කරගත යුතු අතර කටපාඩම් කිරීම උපකාරකයක් නොවේ.

**පොදු නිරීක්ෂණ**

1. සිසුන් බදු නීතියට වන සංශෝධන දැන සිටිය යුතුය.
2. බදු පරිපාලනය සඳහා වන ප්‍රතිපාදන හොඳින් කියවා අවබෝධ කරගත යුතුය.
3. බදු පරිපාලනයට අදාල ප්‍රතිපාදන අදාළ කිරීම පිළිබඳව හොඳින් හැදෑරිය යුතුය.
4. සාමාන්‍යයෙන් විෂය නිර්දේශයට අයත් යම් කොටස් විශේෂයෙන් බදු පරිපාලනය යටතේ ආවරණය කරමින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් පෙළඹී සිටී. එනම්, ඔවුන් දන්නා දේ ලිවීම මිස අසා ඇති ප්‍රශ්නයට අදාළ පිළිතුර සැපයීම නොවේ. බදු ප්‍රශ්න නිශ්චිත වන අතර ඒවාට නිශ්චිත පිළිතුරු අවශ්‍ය වේ. දීර්ඝ පිළිතුරු ලියා පිටු පිරවීමෙන් ලකුණු නොලැබෙන බව අපේක්ෂකයන් සිහි තබා ගත යුතුය.

- * * * -